සාර්ථක ගෙවත්තක - අතුරු කතාවක්................

# අභියෝගයට අභියෝගයෙන් පිළිතුරු දීම

සුනාමිය මිනිසුනට බොහෝ දේ අහිමි කළේය. ඇඳි වත පමණක් ඉතිරිව ජීවිතය අළුතින් පටන් ගන්නට සිදු වූ මිනිසුන් පිළිබඳව, බොහෝ දෑ ලියැවුනි. අළුතෙන් ජීවිතය පටන් ගත් මිනිසුන්ගේ ව්‍යාපාර කටයුතු පිළිබඳව ලියැවුනි. කොහේදෝ පැවති අතපසු වීමක් හේතුවෙන් අළුතෙන් ජීවිතය පටන් ගත් ගොවි ජනතාව පිළිබඳව ප්‍රමාණවත් යමක් ලියැවුනි ද යන්න සැක සහිතය.

"තෙන්නකෝන්ගම", යාය වලදර, වං ඇල ගොවි සමිතියේ ලේකම් සෝමපාල මුණසිංහ මහතා හොඳ ගොවියෙකි. සිය ගෘහස්ථ පාරිභෝජනය සඳහා එවකට ඔහු සතුව ඉතා දැකුම්කළු ගෙවත්තක් පැවතුනි.

"සුනාමියට ඔක්කොම විනාශ උනා ඉතුරු උනේ මේං.... මේ.... පොල් ගස් ටික විතරයි. ඒ විතරක් යෑ දෙල්ගස්, කොස් ගස් ඔක්කොම මැරුණා. ඉතුරු වෙච්ච පොල් ගස් වලත් අස්වැන්න හොඳටම අඩු උනා".

"ඉතිං... .ඊට පස්සේ ගොවිතැන එපා උනේ නැද්ද?" **ගොවි ජනතා**" වෙනුවෙන් අපි විමසුවෙමු.

ගොවිතැන කියන එක එපා වෙන දෙයක් ය. වගා කරන්න, කරන්න ආස හිතෙනවනේ. සුනාමියෙන් පස්සේ මේ ගෙවත්ත අලුතෙන් පටන් ගත්තේ ඒකයි.....

"හැබැයි වාසනාවකට වගෙ මේ ගෙවත්ත පටන් ගන්න විශේෂ හේතුවක් උනේ මේ අලුත් වැඩ සටහනයි. ඒ කියන්නේ "අපි වවමු - රට නගමු" වැඩ සටහන. අපි සමහර දේවල් වගා කරල තිබුන. ඒත් ක්‍රමවත්ව වගාව පටන් ගත්තේ මේ වැඩ සටහන නිසයි. තරගයක් පවා තියන නිසා ටිකක් උනන්දුවෙන් වැඩ කරනවා. නෝන තමයි ඒක හින්දම වැඩියෙන් වගා කරන්නේ....."

ඔහු එක දිගට කථා කරයි. ඒ අතර ඔහුගේ ආදරණීය භාර්යාව ද අපේ සංවාදයට එක් වූවාය.

"අපිට අම්බලන්තොට- ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවෙන් නොමිලයේ බීජ ලැබුණා. ඊට අමතරව කෘෂිකර්ම නිළධාරී මහත්තුරු ඇවිත් වගා උපදෙස් දෙනවා. ඉතින් අපට තියෙන්නේ වගා කටයුතු කරල වගාව රැක බලාගන්න විතරයි...."

"දැන් කඩවල් වලින් ගිණි ගණන් වලට වස විස සල්ලි දීල ගන්න ඕන නැනේ. ගෙදර හදන කොම්පෝස්ට් දාන්නෙ. හාල් තුන - පහ ටිකයි, ලුණු ටිකයි අනෙක් බොහොමයක් දේවල් මේ ගෙවත්තේ තියෙනවා".

සෝමපාල මුණසිංහ මහතාගේ ගෙවත්තේ බෝග අතර බතල, දඹල, මෑ, කව්පි, හබරල, මඤ්ඤොක්කා, වම්බටු, බණ්ඩක්කා, කොළ ගෝවා, මිරිස්, මුකුණුවැන්න, නිවිති, රට හුලංකීරිය, කෙසෙල් වැනි බෝග වර්ග රැසකි. ඒ බෝග වර්ග බොහොමයක් වගා කළේ මමමයි යනුවෙන් ඒ මහතාගේ බිරිඳ අපට කීවාය. එපමණක් ද නොවේ. එකී ගෙවත්තේ කෝමාරිකා, කහ වැනි බෝග වර්ග ද පවතින බැව් අප නෙත් ගැටුනේය.

"මේ ඉඩම අක්කරයක් විතර තියෙනවා. ඒකෙන් හරි අඩකටත් වඩා දැන් මගේ ගෙවත්තයි. මේකේ හැදෙන දේවල් අපි අහල පහල අයටත් දෙනවා...."

"මම ඉස්සර වැඩ කෙරුවේ සමුපකාර දෙපාර්තමේන්තුවේ යි. ඒකෙන් විශ්‍රාම ගියාට පස්සේ මම ගොවිතැන පටන් ගත්තා. ගොවිතැනට අමතරව මම පොල් මණ්ඩලෙන් දෙන පොල් පැල, තැඹිලි පැල බෙදා හරිනවා. දැන් ඉතින් මට තිබෙන ප්‍රශ්නය වතුර මෝටරයක් ගන්න එකයි. මහත්තයලට ඇහැකිය...?"

අපි ඔහුගේ කතාවට සවන් දුනිමු. ඔහුගේ අවසාන ඉල්ලීමට අපි නිරුත්තර වීමු. සාර්ථක ගෙවත්තක පසුපස පවතින දුෂ්කරතා ජයගෙන එකී කාර්යයේ නියැලීම, කෙතරම් සුර විරු කමක්දැයි මම මගෙන්ම විමසා ගතිමි.

මේ තවත් කතාවකි. ජීවිතයේ අභියෝගයන් ජයගන්නා මිනිසුන් පිළිබඳව ලියැවුනත් ශ්‍රී ලංකාවේ දකුණු ප්‍රදේශයේ වෙසෙන මෙම පිරිසගේ අධිෂ්ඨානය මුසු කැපවීම සම්බන්ධයෙන් ලියැවුන කිසිවක් ඇතිදැයි සැක සහිතය. මේ දිරියෙන් ඉදිරියට ඇදෙන තවත් දිරිය කතකගේ කතාවයි. අපි එය "දිරියෙන් පෙරටම........" යැයි නම් කලෙමු.

# දිරියෙන් පෙරටම.......

ජීවිතය, ජීවත් කරවන්නට මිනිසුන් විසින් අනේක විධ, විධි ක්‍රමයන් අනුගමනය කරනු ලබයි. එකී විධි ක්‍රමයන් අතර මිහිතලය සමඟ ගැටී, ඉන් ජීවිකාව සරිකර ගැනීම නම් අභියෝගයකි. එකී අභියෝගය ජය ගන්නා මිනිසුන්, ලොවටම සරදම් කරනු ලබයි.

අම්බලන්තොට, තවාලුවිල, බෙලිගාලගොඩ පාරේ බණ්ඩාර ගෙදර නිවැසියන්ගේ නොපසුබට ධෛර්ය සම්බන්ධයෙන් ද එවන් සටහනක් තැබිය යුතුමය. ඒ, එකී නිවසේ එච්.කේ. නිලුකා නිරෝෂිණී මහත්මියගේ උත්සහයේ ඵල ඇගේ නිවසට ගොඩ වූ අපට දැක ගත හැකි වූ නිසාවෙනි.

"කොහොමද .....?" අපි විමසුවෙමු.

"හොඳින් ඉන්නවා......" ඈ සිනහවකින් සංග්‍රහ කරමින් අපට ඇරයුම් කළාය. අපි ඇගෙන් විස්තර විමසුවෙමු.

"මම අ.පො.ස උ/පෙ පන්තියට ගියාට විභාගෙට ලිව්වේ නෑ. විවාහ උනා. මගේ මහත්තයට කොරටුවක් තියනවා එකෙ තියෙන බෝග වර්ග දිහා බලන කොට මටත් ලොකු ආසාවක් ඇති උනා වගා කරන්න. එයයිගේ කොරටුවෙ ගස්ලබු, කෙසෙල් එහෙම යහමින් තියෙනවා. අපේ ගෙදර කෑමට ඒකෙන් බෝග වර්ග ගෙදරට ගේනවා..."

"ඉතින් මේ කොරටුවෙන් විතරක් ජීවත් වෙන්න පුළුවන්ද,...." අප සමඟ ගිය සගයෙකු විමසීය.

"අපේ ගෙදර පස් දෙනයි. ඒ දරුවෝ තුන්දෙනයි අපි දෙන්නයි. අපට කොරටුවට අමතරව තව අඳ කුඹුරු අක්කර දෙකක් තියෙනවා". කොරටුවෙ එළවළු තියෙනවා. ඈ දිගින් දිගටම කියවාගෙන යන්නීය. ඇගේ කතාව රසවත් ය. ධෛර්ය උපදවන සුළුය. ඇගේ ඇකයේ ද දරුවෙකි. අපි අගෙන් ඒ පිළිබඳව විමසුවෙමු.

"බබා හවස් වරුවට නිදාගන්නවා. ඒ වෙලාව තමයි ඉතින් මේ වැඩට යොදා ගන්නේ....."

"එතකොට පොහොර ගෙනෙන්නේ.....?" අගේ කතාව අතරට අපි බාධා කරමින් පැනයක් යොමු කළෙමු.

"අනේ...... අපි පොහොර අහුලගෙන ඇවිත් දමනව, ඊට අමතරව දිරා ගිය කොළ රොඩු එහෙමත් දානව. මේ ළඟදී කොම්පෝස්ට් කොරටුවක් පටන් ගත්ත. අර තියෙන්නේ....." ඇය අත දිගු කොට පෙන්වයි.

"අපි වවමු - රට නගමු" වැඩ සටහන ගැන ලොකු පැහැදීමක් තිබුණා. කෘෂි රැස්වීමේදී ඒ ගැන කතා උනා. ඒතනදී ඇති වූ උනන්දුව තමයි ප්‍රධාන උනේ. ඒත් මෙච්චර බෝග වර්ග පිළිවෙලට, වගා උපදෙස් වලට අනුව වගා කෙරුවෙ ගෙවතු වගා තරගයට ඉදිරිපත් වෙන්න ඕන නිසයි...."

ඇගේ ගෙවත්තේ මෑ, වැටකොළු, පතෝල, කරවිල, දඹල, බණ්ඩක්කා, වම්බටු, තක්කාලි, කව්පි, ඉරිඟු, අමු මිරිස්, මාළු මිරිස්, බීට්, නෝකෝල්, මල් ගෝවා, ගෝවා, රාබු, මඤ්ඤොක්කා, ගොටු කොළ, නිවිති, අසමෝදගම්, ලබු, කතුරුමුරුංගා, දෙහි, ඇඹරැල්ල වැනි බෝග වර්ග රැසකි.

"අපට කෘෂිකර්මෙන් බීජ ඇට ලැබුනා. ඒ අය අඩුම ගානෙ මාසෙකට දෙපාරක් විතර අපේ වගා කටයුතු බලන්න එනවා...... ඒක අපට හයියක්...."

"මේ බිමේ වැවෙන තණකොල පාලනය කර ගැනීම තමයි ඉතින් දැනට නම් ප්‍රශ්නයකට තියෙන්නේ. බෝග වර්ග කෘමීන්ගෙන් ආරක්‍ෂා කර ගන්න දැනට නම් ඉතින් කොහොඹ කොටල ඉස්ම අරගෙන ඉහිනවා........" ඇගේ කැපවීම සැබවින්ම අදහා ගැනීමටත් අසීරුය. කුඩා දරුවෙකු ඇකයේ රඳවාගෙන සිටින මවකට මෙවන් අපූරු ගෙවත්තකට ජීවය ලබාදීම, සමස්ථ කාන්තා පරපුරටම මහඟු ආදර්ශයක් නොවන්නේ ද.......?

අපි ඇගෙන් සමුගන්නා මොහොතේ දී ඈ සඳහන් කල කරුණකින් මෙම ලිපිය නිම කරමු.

"මහත්තයල ඉඳහිටලවත් ඇවිත් යනව නම් ඒක ලොකු දෙයක්, අපේ දේවල් බලල අපිව අගය කරන කොට අපේ හිතේ ධෛර්ය තවත් වැඩි වෙනවා......"


**එස්.ඒ.සී.යූ. සේනානායක**

*ප්‍රචාරක හා ප්‍රකාශන නිළධාරි*

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.


**********************************